# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. SA/SD/03/06/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015.05.27 |

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක : 242/2015

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

<u>නව CIGAS වැඩසටහන පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වීම</u>

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නව පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම් පද්ධතිය (Computerized Integrated Government Accounting System – CIGAS) සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් නිරන්තරයෙන් සිදුකරනු ලබන අතර ඒ හා සම්බන්ධ ක්‍රියාත්මක කිරීමේ උපදෙස් ද දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් නොමිලේ ලබා දෙනු ලබයි. එම නව වෙනස්වීම් පිළිබඳ දැනුමක් නොමැති බාහිර පුද්ගලයන් විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුදැනුමෙන් තොරව මුදල් අයකරමින් නව CIGAS වැඩසටහන පිළිබඳව පුහුණු පාඨමාලා පවත්වන බව දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. යාවත්කාලීන කරන ලද නව CIGAS වැඩසටහන අනුව ගිණුම් වාර්තා පිළියෙල නොකිරීම නිසා සමහර ආයතනවල ගිණුම් ප්‍රකාශවල නිවැරදිතාවය පිළිබඳව ගැටළු මතු වී ඇති අතර ඒ හේතුවෙන් නියමිත දිනට ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමට නොහැකි වූ අවස්ථා ද වේ. මීට අමතරව ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී සිදුවන වැරදි නිවැරදි කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට අතිරේක කාලයක්ද වැය කිරීමට සිදු වී ඇති අතර එවැනි දෝෂ සහිත පුහුණුවීම් ලද නිළධාරීන්ගේ වැරදි මත නිවැරදි කිරීමද අපහසු වී ඇත.

02. එබැවින් CIGAS වැඩසටහන සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නොමිලේ මෙහෙයවනු ලබන පුහුණු පාඨමාලා හැර වෙනත් බාහිර පුද්ගලයන් විසින් මෙහෙයවනු ලබන පුහුණු පාඨමාලාවලට නිළධාරීන් යොමු නොකර ඔබ ආයතනයට අවශ්‍ය පුහුණු වැඩසටහන් පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කර අවශ්‍ය සහාය ලබා ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

03. තවද වැරදි උපදෙස් අනුව ගිණුම් ප්‍රකාශවල සිදුකරනු ලබන වැරදි සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වගකීමට නොබැඳෙන අතර එවැනි දෝෂ සහිත මාසික ගිණුම් සාරාංශ හෝ ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශ මුදල් රෙගුලාසි 426 ප්‍රකාරව ඉවත්කර මාසික භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට සිදුවනු ඇත.

Aramarayake

ඩී.එම්.ඒ.හරස්ගම
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත :- විගණකාධිපති


මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka. General - Tel.: +94 112 484600 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 112 484728 Fax: +94 112 473856 e-mail: dgsa@sad.treasury.gov.lk Additional Director General - Tel.: +94 112 484898
Director (Accounting & Reporting): +94 112 484747 Director (Accounting Services): +94 112 484753 Director (Systems & Training): +94 112 484733